www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සීඅයිඒ වධ බන්ධන: ඇමරිකාවේ ප්‍රජාතන්ත්‍රවාදය කුනු වීමේ සලකුනක්

**CIA torture: American democracy in shambles**

**2014 දෙසැම්බර් 11**

ඇමරිකාවේ සෙනේට් සභාවේ රහස් තොරතුරු කමිටුව සීඅයිඒ වධබන්ධන ගැන නිකුත් කර ඇති වාර්තාව මගින් බොරු නො කල හැකි නිගමන දෙකක් මතු වෙයි: 1. බුෂ්ගේ පාලන කාලය තුල දී එක්සත් ජනපදය ජාත්‍යන්තර සහ දේශීය නීති උල්ලංඝනය කරමින් ඉතා බරපතල සාපරාධී ක්‍රියා කර ඇත. 2. මේ අපරාධවලට වගකිව යුතු වූ කිසිවෙක් අත්අඩංගුවට ගැනීම හෝ ඔවුන්ට විරුද්ධව චෝදනා ඉදිරිපත් කිරීම හෝ නඩු ඇසීම නො කෙරෙනු ඇත.

සීඅයිඒ වධ බන්ධන වැඩ සටහන මීට කලින් ද එළිදරව් වී තිබුනු නමුත් ලෝකයේ ම හෘද සාක්ෂිය කම්පනයට පත් කලා වූ මෙම අපරාධ ගැන රාජ්‍ය නිල ආයතනයකින් ම නිකුත් කල සවිස්තර වාර්තාවක් දුන් අප සතුව පවතී. එක්සත් ජනපදයේ ජනාධිපති ගේ නිශ්චිත අධිකාරය සහ මෙහෙයවීම මත ක්‍රියා කල සීඅයිඒ නියෝජිතයෝ වධ දීමේ අපරාධ ගනයට ඉතාමත් ම පැහැදිලි ලෙස අයිති වන ක්‍රියාවල යෙදී ඇත. එළිදරව් නොකල යුතු ලෙස වර්ග කර ඇති දීර්ඝ වාර්තාවකින් කපා කොටා සකස් කර ගත් සාරාංශයක් වන මෙම වාර්තාවට අනුව, කර ඇති සමහර වධදීම් මෙසේ ය. අත් පා කැඩී බිඳීගිය අය ඇතුලු සිරකරුවන් බිත්තියක දම්වැල්වලට ගැට ගසා දින 17ක් සිටගෙන සිටීමට සැලැස්වීම සතියකට වඩා කාලයක් තුල නිදාගැනීමට ඉඩ නොදීම, ඝාතනය කිරීමේ ඉරියව්වලින් ග්‍රස්තයට පත් කිරීම සහ පනපිටින් වලලා ප්‍රානය නිරුද්ධ වීමට පෙර ගොඩ ගැනීමත්, අයිස් වතුරේ තබා අධික ශීතල කරවීම hypothermia-yhsm යනුවෙන් හැඳින්වෙන මරනාසන්නයට පත්වන තත්ත්වය දක්වා ශරීරය ගෙන ඒමත්, 'වෝටර්බෝඩිං (waterboarding) හෙවත් (මෙම වධදීමේ ක්‍රමයට අනුව සිරකරුවා දියේ ගිලී හුස්ම හිරවන බව දැනෙන තෙක් නාසයට හා කටට වතුර වක් කරමින් නැවත නැවතත් මරනාසන්න තත්ත්වයට ගෙන එනු ලැබේ) නැවත නැවත පහර දීම මගින් වකුටු වී බියෙන් හැකිලෙන සහ යටත් වීමේ මානසික තත්ත්වයට ගෙන ඒම ආදී වශයෙනි.

ඉතාමත් ම අධම සහ විකෘති මානසික හැසිරීම්වල ස්වභාවය ගනු ලැබූ මෙවැනි ක්‍රියා, අබුග්‍රයිබ් සිරගෙදර දී කරන ලද වධදීම් අහම්බ සිදු වීම් නො වන බව පෙන් වීය. මෙහි දී පාවිච්චි කෙරුනු ක්‍රම අතර මුඛය වෙනුවට අධෝමාර්ගය තුලින් ආහාර ඇතුලට යැවීම, සහ එම ක්‍රමය මගින් ම ප්‍රතිවිජලනය කිරීම ආදිය ද විය. මෙම වධදීම්වලට ගොදුරු වූවෙක් වන මජීඩ් ඛාන් ගේ නීතිඥයාට අනුව ඔහු බලහත්කාරයෙන් දූෂනය කිරීම සහ දරුනු ලිංගික ප්‍රහාරයන්ට ගොදුරු කරන ලදී. සීඅයිඒ පාලනය යටතේ සිටිය දී ඔහු කිහිප වතාවක් ම තම ජීවිතය නසා ගැනීමට උත්සාහ කර ඇත. ඔහු දැනට ගුවන්තනාමෝ බොක්කේ සිරකඳවුරේ සිරකර ඇත.

පවතින නීතිය අතිශයින් ම පැහැදිලි ය. වධදීම් වලට අදාල පෙඩරල් පනතට අනුව, වධදීම නිර්වචන කර ඇත්තේ 'බරපතල ශාරීරික හෝ මානසික වේදනාවන් සිදු කිරීම අරමුනු කර ගත් ක්‍රියාවක්' යනුවෙනි. එම පනතට අනුව "වධදීම් කරන හෝ කිරීමට උත්සාහ කරන ඕනෑම අයෙකුට දඩ ගැසීමේ සිට අවුරුදු 20 කට නොවැඩි කාලයක් සිරගත කිරීමේ දඬුවම් නියම කෙරේ." සීඅයිඒ විසින් වධදීමට ලක් කරනු ලැබූ අයගෙන් අඩු වශයෙන් එක් අයෙක් මරනයට පත් වී ඇත. මෙ වැනි අවස්ථාවල දී එවැන්නකට වරදකරු වන අය හෝ කන්ඩායමට "මරන දඬුවම නැතහොත් ඕනෑම කාලයකට හෝ ජීවිතාන්තය දක්වා හෝ සිර ගත කිරීම මගින් දඬුවම් කරනු ලැබේ".

වධදීම් ජිනිවා ප්‍රඥප්තිය යටතේ යුද අපරාධයක් ලෙස වර්ග කර ඇති අතර ජාත්‍යන්තර නීතිය අනුව එම ප්‍රඥප්තිය සහ වධදීමට එරෙහි ප්‍රඥප්තිය මගින් වධදීම් තහනම් කර ඇත. ඇමරිකාව ඇතුලු ප්‍රඥප්තීන්ට අත්සන් කර ඇති රාජ්‍යයන් විසින් එම නීතිය උල්ලංඝනය කරන්නන්ට නඩු පැවරීම අත්‍යාවශ්‍ය කෙරේ. වධදීම්වලට එරෙහි ප්‍රඥප්තියට අනුව වධදීම මොනම කොන්දේසියක් යටතේ හෝ නොකල යුතු බවට නිර්දේශ කල යුතු වෙයි. එනම් කිසිම හේතුවක් මත එය යුක්ති සහගත නො කෙරේ.

ප්‍රති-ත්‍රස්තවාදය සහ මානව අයිතීන් පිලිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ සම්බන්ධකරු වන බෙන් එමර්සන් සෙනේට් වාර්තාව ගැන මෙසේ ප්‍රකාශ කලේ ය. "මෙම අපරාධ සැලසුම් කිරීම හා ඒවාට අනුමැතිය දීම කලේ යැයි පැවසෙන අයට ඉහල ම දඬුවම් නියම කල යුතු ය." එසේ වරදට හසුවන අය අතර වධදීම් අධීක්ෂනය කලා වූ ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් සහ උපජනාධිපති ඩික් චෙනී, ඒවා නිල වශයෙන් අනුමත කල සීඅයිඒ අධ්‍යක්ෂකව සිටි ජෝර්ජ් ටෙනට්, එකල ටෙනට් ගේ විධායක සහකරු වූ සහ වර්තමාන සීඅයිඒ අධ්‍යක්ෂවරයා වන ජෝන් බ්‍රෙනාන්, කුප්‍රකට වධදීම් නිර්දේශවල කතෘවරුන් වූ ජෝන් යී සහ ජේ. බයිබී යන අධිකරන දෙපාර්තමේන්තුවේ නීතිඥයින් දෙදෙනා, වධදීමේ ක්‍රම සකස් කල මානසික විද්‍යාඥයින් සහ සීඅයිඒ උපදේශකයින් වූ බ්‍රැස් ජෙසන් හා ජේම්ස් මිචෙල්, අබු සුබෙයිදා "වෝටර්බෝඩිං" ට ලක් කිරීමට අනුමැතිය ලබා දුන් හිටපු ජාතික ආරක්ෂක උපදේශක කොන්ඩොලීසා රයිස් සහ මෙම අපරාධ වාර්තා ගත කර තිබුනු වීඩියෝ පට විනාශ කිරීමට අනුමැතිය දුන් සීඅයිඒ ත්‍රස්ත විරෝධී අංශයේ නායක ජුසේ රොඩ්‍රිගස් ආදීහු වෙති.

කවර හෝ වෛෂයික ප්‍රමිතියක් අනුව තක්සේරු කලත් මෙම පුද්ගලයින් සියලු දෙනාමත් මේවාට සම්බන්ධ වූ තවත් බොහෝ දෙනකුත් අත් අඩංගුවට ගෙන නඩු පැවරීමට ගොදුරු

විය යුත්තන් බව නිසැකය. සෙනේට් වාර්තාවේ අඩංගු කර ඇති අපරාධ ගැන සලකා බලන විට විටෙක ජනාධිපති නික්සන් දෝෂාභියෝගයට ලක් කර ද ඔහුට ඉල්ලා අස් වීමට බල කෙරුනු අපරාධ දිස්වන්නේ සුලු වැරදි ලෙස ය. එහෙත් අපරාධ ගැන වගකීමට ලක් වන අය වගකීමට බැඳීම ගැන බිය වී සිටිනවා වෙනුවට නිර්ලජ්ජිතව ඒවා ආරක්ෂා කරති.

සෙනේට් වාර්තාව මත කිසිම පියවරක් ගැනීම ඔබාමා පාලනය දැනටමත් ප්‍රතික්ෂේප කර ඇත. මෙම අපරාධ සම්බන්ධයෙන් කිසි කෙනෙකුට වගකීම ක්‍රියාත්මක කරවීමක් නො කෙරෙන්නේ ය යන ඔහු ගේ පරිපාලනයේ ස්ථාවරය නැවතත් ප්‍රකාශ කෙරෙන්නා වූ සුදානම් කෙරුනු ප්‍රකාශනයක් ඔබාමා අගහරුවාදා එළි දැක් වීය. ඔහු මෙසේ ලීවේ යග "පරන තර්ක මත නැවතත් සන්ධු කරනවා වෙනුවට මෙම විධික්‍රම ඒවාට උචිත ස්ථානය වන අතීතයට අතහැර දැමීමට මෙම වාර්තාව උදව් වන්නේ යැයි මම ප්‍රාර්ථනා කරමි."

සෙනේට් වාර්තාවේ විස්තර කර ඇති ක්‍රියා ආරක්ෂා කිරීමට හැකි ඉහල ම උත්සාහය දරමින් ඔබාමා ප්‍රකාශ කලේ "අල් කයිඩාව පසුපස හඹා යන්නේත් අපේ රටට එරෙහිව තවත් ත්‍රස්තවාදී ප්‍රහාර නවත් වන්නේත් කෙසේද? යන්න ගැන" බුෂ් පාලනයේ නිලධාරීන් "වේදනා සහගත තෝරා ගැනීම්වලට මුහුන දුන්නා'' යනු වෙනි. ලෝකයාට අලුතින් ම දැන ගන්නට ලැබුනු අපාරාධ සිදු කලා වූ සීඅයිඒ නිලධාරීන් සම්බන්ධයෙන් ඔහු ප්‍රකාශ කලේ "ඔවුන් කැප වී වැඩ කල මිනිසුන් සහ ගැහැනුන්" බව ය. "දේශප්‍රෙමීන්" වූ ඔවුන්ගේ "වීර සේවය සහ කැප කිරීම්" සමස්ත රට විසින් ම අගය කල යුතු බව ය.

ඔබාමා පාලනයේ ප්‍රතිචාරය මගින් හෙලිදරව් කෙරෙන්නේ යි. මෙම නීති විරෝධී ක්‍රියාවන් නවත්වා ඇතැ යි ඔබාමා ගේ ප්‍රකාශය බොරුවක් බවයි. මෙම විශේෂිත සීඅයිඒ ක්‍රියාමාර්ගය දැනට නවත්වා ඇති නම් දැන් ඒ වෙනුවට ඒ හා සමානව ම අපරාධකාරී වන්නාවූ වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාවේ යොදවා ඇති සියල්ලටමත් වඩා, ලෝකයේ සෑම ප්‍රදේශයකම සිටි දහස්ගනනක් ජනයා ඩ්‍රෝන්යානා යොදවා ඝාතනය කිරීම කැපී පෙනෙයි.

අපරාධකරුවන්ට තම ක්‍රියාවන් රිසිසේ යුක්ති සහගත කිරීම සඳහා පුවත්පත් පිටුවල සහ රූපවාහිනි වැඩ සටහන්වල ඉහලින් ම ඉඩ ලබා දී ඇත. සෙනේට් වාර්තාව මුලුමනින්ම සහ ඉක්මනින් ම වල දමා ප්‍රතිපත්තිවල ආයුධයක් ලෙස වධ දීමේ සාර්ථක හෝ අසාර්ථක බව ගැන සාකච්ඡාවක් ගෙන යෑමට අවධානය දීමේ සංවිධිත උත්සාහයක් පවතී. ප්‍රධාන ජාතික පුවත්පත්වල මෙන් ම ප්‍රාදේශීය පුවත්පත්වල කතුවැකි ද වධකයින් සමග අප්පිරියා සහගත සහෝදරත්වයක් ප්‍රකාශ කරති.

නිල මාධ්‍යවල කිසියම් විවේචනයක් අඩංගුවේ නම් ඒවා මුලුමනින් ම නිෂ්ක්‍රිය වූ ඒවා ය. ඩිමොක්‍රැටික් පක්ෂයේ කොටස් වෙනුවෙන් කථා කරන්නා වූ *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පතේ බදාදා ලියූ කතු වැකිය මේ සඳහා හොඳම උදාහරනයකි. කතුවරුන් සෙනේට් වාර්තාව විස්තර කරන්නේ "වටහා ගැනීමට අපහසු වුත් පිලිගැනීමට ඊටත් වඩා අපහසු වු ත් පාපිෂ්ඨත්වය පිලිබඳ චිත්‍රයක්" යනුවෙනි. "අපේ ඉතිහාසයේ මෙම පරිච්ඡේදයේ පිටු වසා දැමීම" ට පරිපාලනය ගත් "භයංකාර තීන්දුව" ගැන ඔව්හු කනගාටු වෙති.

*ටයිම්ස්* පුවත්පතේ නිගමනය කුමක් ද? "දැන් මේ ගැන කිසි දෙයක් කෙරේ යැයි විශ්වාස කිරීමට අපහසු ය" යනුවෙන් පුවත්පත ලියයි. කතුවැකිය අවසන් කෙරෙන්නේ පහත සඳහන් ලාමක අපේක්ෂාවෙන් යුක්තව ය. "මෙම අධම කාල පරිච්ඡේදය තුල දී සීඅයිඒ ය පාලනය කල ජෝර්ජ් ටෙනෙට් කල වැරැද්ද වෙනුවෙන් ගෙවන අවම අලාභයක් ලෙස ඔහු විශ්‍රම ගනිද්දී ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් දුන් පදක්කම ආපසු භාර දීම සුදුසු ය". බියගුලුකම පිලිබඳව මොනතරම් නම් නින්දිත ප්‍රකාශයක් ද?

වධ දීමේ වැඩ සටහන මෙන් ම ඊට වගකීම කිසිවෙකුට පැටවීමට නො හැකි වීම ද ඇමරිකානු එක්සත් ජනපදය පාලනය කිරීමේ ආන්ඩුක්‍රම ව්‍යාවස්ථානුකූල පාලන ක්‍රමවල කඩා වැටීම පෙන්නුම් කරයි. අපරාධයක් සිදු කර ඇතත් ඒවා ලෝකයම ඉදිරියේ හෙලිදරව් කෙරී ඇතත් එහෙත් නිල දේශපාලන අංශ තුල ඒ ගැන කිසිවක් කිරීමට නො හැකි ය, කිසිවක් කෙරෙන්නේ ද නැත.

මේ තත්ත්වයන් යටතේ කිසිවෙකුට තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කල නො හැක. එක්සත් ජනපදය පාලනය කෙරෙන්නේ සෑම නීතිමය සීමාවකටම පිටින් කටයුතු කරන්නා වූ දැවැන්ත මිලිටරි-රහස් පරීක්ෂක යාන්ත්‍රනයක් විසිනි. මෙම යාන්ත්‍රනය කටයුතු කරන්නේ සීඅයිඒ වධකයින්ටත් නො අඩු ලෙස තම ක්‍රියාවන් සඳහා වගකිවයුතු වීමෙන් නිදහස් කෙරුනු මූල්‍යමය වංශාධිපති පෙලැන්තියක් මගිනි. ජාත්‍යන්තරවත් එක්සත් ජනපදය තුලත් ජනතාවන් ගේ සමාජ සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහිව කෙරෙන සාපරාධී කුමංත්‍රනයක් සම්බන්ධව සමස්ත පාලක පන්තිය මතට ම වගකීම පැටවී ඇත.

වධදීම ගැන කරන්නා වු වංචනික ප්‍රකාශ තුලින් ඔබාමා නො පැකිල ප්‍රකාශ කරන්නේ එවැනි තිරිසන් ක්‍රියා "අපේ සාරධර්මයන්ට පටහැනි" බව ය. ඔහු පවසන්නේ ඒවා "අපේ හැටි" නො වන බවයි. ඇත්තෙන් ම කියනවා නම් සීඅයිඒ සංවිධානයේ ප්‍රචන්ඩ ක්‍රියා පාලක පන්තියේ ස්වභාවය ම වන්නේ ය.

මෙම අපරාධ කරන්නේ විදේශයන් තුල දී පමනක් නො වේ. ඇමරිකාවේම ජනතාවට එරෙහිව ක්‍රමයෙන් වැඩි කෙරෙන ප්‍රචන්ඩ ක්‍රියා ද මිලිටරිකරනය කරන ලද පොලිසිය කිසිම ආදීනවයකට යටත් නොවී කරන්නා වූ දන්ඩ මුක්තික පොලිස් මිනිමැරුම් ද ඉහත කී ක්‍රියාදාමයේ ම තවත් කොටසකි. එම ක්‍රියාදාමය වන්නේ හමුදා බැරැක්ක රාජ්‍යයක් බවට රට පරිවර්තනය කිරීමයි. මෙතෙක් නොවූ විරූ මට්ටම්වලින් පවතින්නා වූ සමාජ අසමානත්වයේ බලපෑම් යටතේ විදේශයන්හි කෙරෙන මිලිටරි ආක්‍රමන රට තුල ඒකාධිපතිත්වයක් බවට හැරෙමින් පවතී.

හදිසි නිගමන දැන් ඇතිකර ගත යුතු ය. රාජ්‍යයේ එක ම කන්ඩායමක් හෝ කරන්නා වූ ආයාචනා මගින් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කර ගැනීමට හැකි වේය යන්න විශ්වාස කිරීම දේශපාලන වශයෙන් අර්ථ විරහිත වන්නේ මෙන් ම භයානක මනෝ විකාරයක් ද වන්නේ ය. තමා ගේ සියලුම ක්‍රියාවන් තුලින් පාලක පන්තිය නැවත නැවතත් පෙන්වා සිටින්නේ ප්‍රජාතන්ත්‍රවාදී පාලක විධික්‍රම නොතකා හැරීම පමනක් නො ව ඒවාට එරෙහි ව දක්වන ද්වේශකාරිත්වයයි.

මෙහි අර්ථය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම විප්ලවීය කර්තව්‍යයක් බවයි. පාලක පන්තියේ පොලිස් රාජ්‍ය විධික්‍රමවලට විරුද්ධත්වය පෑ හැක්කේ සංගතමය සහ මූල්‍ය වංශාධිපති පෙලැන්තියට සහ ඔවුන්ගේ රාජ්‍ය සංස්ථාවලට එරෙහි ව කම්කරු පන්තිය ස්වාධීනව මෙහෙය වීම මගින් පමනකි.

**ජෝසප් කිෂෝර්**

© www.wsws.org